
ආරම්භය: **1945-09-30** ලි.ප. අංකය: කො **39/482**
දෙහිවල, සුදර්සන පාරේ. ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි දෙහිවල බෞද්ධෝදය සංගමය
මගින් ධම් දානම පිණිස සැම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය



"ධම්මො හවේ රකඛති ධමමචාරි"

71 වර්ෂය - ශ්‍රී බු,ව 2560 | 2016 ජුලි 19 | ඇසළ කලාපය

## කොළඹ දිස්ත්‍රික් පාලි ගුරු උපදේශක,රත්මලාන ශ්‍රී ධර්මාරාම පුරාණ විහාරවාසි රාජකිය පණ්ඩිත ශාස්ත්‍රපති පුජ්‍ය කොටනෙළුමේ පුඤ්ඤානන්දහිම්පාණෝ

## ඇසළ මසෙන් උදාවන අපේ කඨින පින්කම් (පළමු කොටස )

**පඨවීරිව න ජාතු කම්පතෙ - න චලති මෙරුැරිවාති වායුනා**
**වජිරම්ව න භිජ්ජතෙ ඝනං - තම්ධමතො කඨිනන්ති වුච්චති**

මෙම ගාථාවට අනුව මහ පොළොව කම්පා නොවන්නාසේ ද, මහා මේරු පර්වතය සුළඟින් නොසෙල් වෙන්නා සේ ද, මහා වජ්‍ර පර්වතයක් බිඳීමට නොහැකි වන්නා සේ ද, කඨිනයේ ආනිසංස විනාස නොවේ. මේ ගාථාවට අනුව විමසා බැලිමේ දී අප කඨිනය කියා භාවිත කරන වස්ත්‍රය හෝ සිවුර කඨිනය නොව එහි ආනිසංස පක්ෂයම කඨිනය ලෙස සැලකිය යුතු වේ.

වසරේ ඕනෑම දිනක ඕනෑම තැනකදී ඕනෑම කෙනෙකුට කළ හැකිය. එහෙත් කඨිනය එසේ කළ නොහැක. වසරකට එක් වරක් පමණක් කළ හැකිවේ. එයද කිරිමට උපසපන් හාමුදුරුවන් වහන්සේ නමක් සිටිය යුතුය. උන්වහන්සේ ද වස් වසා වස් ආරක්ෂා කරමින් වැඩ සිටිය යුතුය. වස් පින්කම කිරිමට ස්ථානයක් ද තිබේ. ඒ වස් වසා වැඩ සිටි ස්ථානයයි. මෙම වස්කාලය අවසානයේ පුජා කරන වස්ත්‍රය හෝ සිවුර අපි කඨින වස්ත්‍රය හෝ කඨින සිවුර කියා කියමු.

එසේ කඨින සිවුර කියා කීවත් කඨිනය යනු එහි ආනිසංස පක්ෂයට කියන නමකි. කඨිනයෙන් ලැබෙන ආනිසංසය කිසිදා සෙලවිය නොහැකිය. මහ පොළොව කම්පා වන්නේ කාරණා අටකට පමණි. ඒ හැර කම්පා නොවන්නේය. එසේම මෙහි ආනිසංස ද කම්පා නොවේ. මහාමේරු පර්වතය කොතරම් සුළඟ හැමුවත් සෙලවිය නොහැක. එසේම මෙහි ආනිසංස ද සෙලවිය නොහැකිය. වජ්‍ර යනු දැඩි වු ද ශක්තිමත් වු ද දෙයකි. ඒවා කුඩු කිරිමට හෝ කැඩීමට පහසු නොවේ. එසේම කඨිනයේ ආනිසංස ද ශක්තිමත් වුවකි.

ඒ අනුව කපන්නට, කොටන්නට, කුඩු කරන්නට පුච්චන්නට, විනාශ කරන්නට නොහැකි වූ ශක්තිමත් වූ වටිනා පින්කමක් ලෙස කඨින පින්කම හඳුන්වා දිය හැකිය. සිල්වත් වූ ප්‍රතිපත්ති ගරුක මහා සංඝරත්නය වෙත කඨින සිවුරක් පූජා කොට ආශිර්වාද ලබා ගැනිමට මෙන්ම පින් සිදු කර ගැනිමට දායකයෝ කැමැති වෙති. ඔවුන්ගේ ලෞකික දියුණුව මෙන්ම පරලොව දියුණුව ද මෙවැනි පින්කම් කොට ප්‍රාර්ථනා කරති.

## අපිටත් කඨින පින්කමක් කරන්න බැරිද?

දායකයන් විමසන්නේ අපිටත් කඨින පින්කමක් කරන්න බැරිද? යන ප්‍රශ්නයයි. ඕනෑම කෙනෙකුට සද්ධාව ඇත්නම් කඨින පින්කමක් කරන්න පුළුවනි. එසේ නම් මොනවද අපි කරන්න ඕනෑ යන ප්‍රශ්නය ඇතිවේ. පළමුව උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේ නමක් සොයාගැනීම අවශ්‍ය වේ. උන්වහන්සේට වැඩ සිටීමට ස්ථානයක් (තම නිවසේ හෝ විහාරස්ථානයක්) සොයා ගත යුතුවේ. ඉන්පසුව හාමුදුරුවන් වහන්සේට ආරාධනා කොට වස් තුන් මාසයේ උන්වහන්සේගේ සැප දුක් සොයා බලමින් උපස්ථාන කරමින් තමා ද සිල්වත්ව ගත කිරීම හොඳටම ප්‍රමාණවත් වේ. වස්කාලයේ බොහෝදායක පිරිස් හාමුදුරුවන් වහන්සේට දානය පූජා කිරීමට කැමැත්තක් දක්වති. ඒ නිසා බොහෝ විට දානය අඩුවන්නේ නැත. යම් අවස්ථාවක දානය නොමැති වුවහොත් වස් ආරාධනා කළ කෙනා උන්වහන්සේට දානය දීමට බැඳී සිටිය යුතුයි. මොකද හාමුදුරුවන් වහන්සේලාට දානය නොමැති වුනහොත් වස්කාලය තුළ පිණ්ඩපාතයේ වැඩම කිරීමට ද විනයානුකූලව ඉඩක් නොමැත.

## කඨිනයක් කරන්න හුගාක් වියදම් යනවාද?

අද බොහෝ තැන්වල දායකයන්ට කඨින පින්කමක් කරන්න ආශාව තිබුණද එවැනි පින්කමක් කරන්නට හැකියාවක් නොමැති බව පෙනේ. ඊට හේතුව වියදම් අධික වීමයි. ඒ නිසාම දායකයන් අපෙන් විමසා සිටින්නේ හාමුදුරුවනේ කඨින පින්කමක් කරන්න කොච්චර වියදම් යනවාද? කියා. ඇත්තෙන්ම කඨින පින්කමක් කරන්න ලොකු වියදම් යන්නේ නැත. එහෙත් අද කඨිනය පින්කමක් නොව උත්සවයක් කරගෙන සිටින බවක් පෙනේ.

එදා ගමේ කඨිනය රැගෙන ගියේ පෙරහැරක් ද ඇතිවිය. එදා පෙරහැරේ දායකයෝ සාධුකාර දෙමින් සිවුර බන්දේසියක තබා එය හිසමත තබා ගෙන ගමන් කළහ. එසේ නොමැති නම් කඨින සිවුර මෝල් ගසක ඔතාගෙන දෙදෙනෙකු කරමත තබාගෙන ගමේ ඇවිදීම සිදු කළේ සෙසු දායකයන් සාධුකාර දෙමින් පසුපසින් ගමන් කරද්දීය. කඨින සිවුර රැගෙන එන බව ගමේ අයට දැනගැනීම පිණිස පෙරහැරේ මුලින් බෙරගසමින් හේවිසි හඬ නැංවිය. ශ්‍රද්ධාව පෙර දැරිව ගම පුරා සාධුකාර දෙමින් එදා ගමේ ගිය කඨින පෙරහැර අද වෙනස් වී ඇත.

කසිප්පු බීගත් ගිණිබෝල කරුවන් ද, ඔවුන් වටා රොක් වූ (ශ්‍රද්ධාව නිසා නොව විනෝදය පිණිස) තරුණ පිරිස් ද, හින්දි සිංදු වාදනය කරමින් නටන නැට්ටුවන් ද, සමහරවිට අලි ඇතුන් ද, පිරිවරා ගත් මහා විශාල කඨින පෙරහැර අපට දැකිය හැකිය. බොහෝ පෙරහැරවල ශ්‍රද්ධාව ඉක්ම ගොස් ඇත. විනෝදය හා මානයපෙර දැරිකරගත් තරඟකාරී පෙරහැරවල් ඇති බව නොකියා බැරිය. මෙය සඳහන් කරන්නේ අපේ හාමුදුරුවන්ට හෝ දායකයන්ට දොස් පැවරීමේ අදහසින් නොව හුදෙක් කරුණාව පෙරදැරිවම බව කිව මනාය.

මෙසේ වුවහොත් අපේ සමහර විහාර ස්ථානයක දුප්පත් දායකයෙකුට කිසිදා කඨින පින්කමක් කිරීමට නොහැකි වේ. මන්ද? පෙරහැරට ලක්ෂ ගණන් මුදල් අවශ්‍ය වේ. කඨිනදාට එන මහ පිරිසට කන්න දෙන්න දහස් ගණන් මුදල් අවශ්‍ය වේ. විහාරස්ථානයේ ඇති ගොඩනැගිලි ආදිය හුණුපිරියම් කිරීම ලක්ෂ ගණන් මුදල් වියදම් වේ. හැබැයි මේ එකක් වත් කඨිනයට අත්‍යාවශ්‍ය ඒවා ද කියා විමසිය යුතු ප්‍රශ්නයකි. එසේ සඳහන් කරන්නේ ''අපේ දුප්පත් දායකයෙකුට කිසිදා කඨින පින්කමක් සිදු කිරීමට නොලැබෙන්නේය.'' යන කාරණය නිසයි. කඨිනය යනු පොහොසත් දායකයන්ගේ පින්කමක් පමණක් කියා කීමට සිදු වේ. එය එසේ නොවිය යුතුය.. අපේ දායකයන්ට හැකියාව ඇත්නම් එසේ පෙරහැර කිරීම, එසේ පෙරහැර කිරීම, එන පිරිසට කෑම දීම ආදිය කළාට වරදක් නැත. එහෙත් අද සිදුවන්නේ තරගයට පින්කම් කිරීමකි. පින්කමට වඩා මානය වර්ධනය කරන්නකි. ගිය සැරේ පින්කම කළාට වඩා ඉහළින් මම මේ සැරේ පෙරහැර කරන්න ඕනෑ. නැත්නම් අපේ තත්වෙට හොඳ නැහැ. අල්ලපු පන්සලේ පෙරහැරට වඩා අපේ පන්සලේ පෙරහැර ලොකු වෙන්න ඕනෑ වැනි පහත් ආශාවන් හා මානයන් පෙරදැරිව කඨින කරන දායකයන් අපට දකින්නටලැබේ. එය පින්කමක් නොව තමා නොදැනීම පින්කමේ නාමයෙන් කරගන්නා අකුසල් බව දැනගත යුතුය. අභිධර්මයේ දී මේවාට කියන්නේ වංචක ධර්ම කියාය.

**වස් ආරාධනා කරන්නේ කෙසේ ද?**

තමන් කැමැති හාමුදුරුවන් වහන්සේ නමකට වස් වසන ලෙස ආරාධනා කළ හැකිය. මෙහි දී පළමුව තමන් භික්ෂුන් වහන්සේ වස් වසන්නට සුදානම් වන්නේ කොහිද යන්න තිරණය කළ යුතුය. සමහරු වසන්නට සුදානම් වන්නේ කොහි ද යන්න තිරණය කළ යුතුය. සමහරු තම නිවසේ හාමුදුරුවන් වහන්සේ නමක් වස් වසාගෙන තුන්මාසයක් තිස්සේ ඇප උපස්ථාන කරති. බොහෝ දායකයන් කරන්නේ විහාරස්ථානයක හෝ ආරණ්‍ය සේනාසනයක වස් වසා වැඩ සිටින ලෙස ආරාධනා කිරීමයි.

තමන් කැමැති තැනක් තෝරාගෙන එම විහාරස්ථානයේ හෝ ආරණ්‍ය සේනාසනයේ වැඩ සිටින උපසපන් භික්ෂුන් වහන්සේලාට වස් තුන් මාසය වැඩ සිටින ලෙස ආරාධනා කරයි. මෙය පෞද්ගලික කටයුත්තක් ලෙස කරනවාට වඩා කිහිප දෙනෙකුගේ මූලිකත්වය ගෙන දායකයන් එකතු වී පොදුවේ ආරාධනා කිරීම සිදු වේ.

**යම රජුට පින් දෙන ගාථාව**

**අධිකරණිකො කම්ම විපාකො - යමරාජෝ ඉද්ධිබලෝ**

**අනුමෝදිත්වා ඉමංපුඤ්ඤං - නිබ්බානං සුඛ සිද්ධියා**

මෙහි දී හාමුදුරුවන් වහන්සේලාට දැහැත් ගොටුවක් හා වැසි සළුවක් පූජා කිරීම සිරිතකි. මෙම දැහැත් ගොටු වස් වසන හාමුදුරුවන් ප්‍රමාණය අනුව පිළියෙල කරයි. හාමුදුරුවන් වහන්සේලා එක් නමක් එක දැහැත් ගොටුවක් ද, පස් නමක් නම් දැහැත් ගොටු පහක් ද හත් නමක් වැඩ සිටී නම් දැහැත් ගොටු හතක් ද වශයෙන් පිළියෙල කිරීම සිරිතකි. (වැසි සළුව යනු නානකඩයයි. හාමුදුරුවන් වහන්සේ පැන් පහසු වීමේ දී හැඳගන්නා රෙදි ප්‍රමාණයයි. මේ සඳහා සිවුරු රෙදි පූජා කිරීම සිදු කරයි.) මෙසේ දැහැත් හා වැසි සළු පූජා කොට ''හාමුදුරුවනේ අප කෙරෙහි අනුකම්පාවෙන් මේ තුන් මාසය අප විහාරස්ථානයේ (නිවසේ) වස් වසා වැඩ සිටින්න. අපි ඔබ වහන්සේලාට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව්පසෙන් උපස්ථාන කරමු'' යනුවෙන් ප්‍රතිඥාවක් දෙයි.**(ඉතිරි කොටස ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.)**